# මත්ද්‍රව්‍යය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූ කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්.

*(වැලිකඩ බන්ධනාගාරය ඇසුරින්)*

*ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය*

*ශ්‍රී ලංකාව.*

# මත්ද්‍රව්‍යය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූ කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්.

***(වැලිකඩ බන්ධනාගාරය ඇසුරින්)***

(ස්වාධීන නිබන්ධය)

*සරත් සමරකෝන් බණ්ඩාර,*

*ලි.ප.අංකය:1705 **SS**2012019*

**උපදිෂ්ට ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව**

**අපරාධ විද්‍යාව**

**2017**

## පර්යේෂකයාගේ ප්‍රකාශය.

මෙම පර්යේෂණ නිබන්ධය, මහාචාර්ය එම්. ඩබ්. ජයසුන්දර මහතාගේ උපදේශකත්වය යටතේ, වයි. එම්.ඩබ්. එස්. සමරකෝන් බණ්ඩාර වන මා විසින් ස්වාධීනව සකස් කරන ලද්දක් බවත්, අදාළ දත්ත මා විසින්ම සොයා ගන්නා ලද බවත්, මේ සඳහා යම් ලිඛිත තොරතුරක් යොදාගනු ලැබූ සෑම අවස්ථාවකම ඊට අදාළ මූලාශ්‍රය සපයා ඇති බවත් මෙම නිබන්ධය වෙනත් කිසිම අධ්‍යාපන ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක ඉදිරිපත් නොකරන ලද්දක් බවත් ප්‍රකාශ කර සිටිමි.

ලියාපදිංචි අංකය ඃ 1705 ss2012019 .................................

දිනය ඃ අත්සන

# අනුමැති පත්‍රය.

උපදිෂ්ට ශාස්ත්‍රපති අපරාධ විද්‍යාව උපාධි පාඨමාලාවේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කළයුතු මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය හා උපදේශකත්වය යටතේ සකස් කරන ලද බව සහතික කරමි.

උපදේශකවරයාග් නම : මහාචාර්ය එම්. ඩබ්. ජයසුන්දර මහතා.

උපදේශකවරයාගේ අත්සන. …………………………….

දිනය. ……..…………………….

# පිදුම...

පාරමී දම් පුරා සපැමිණ
මගේ ලෝකය පුරා වැප්ඹෙන
ලේ නහර ඇට මිඳුලු විනිවිද
දැනෙන සෙනෙහස
සෙව්මිණි...
දෙව්මිණි....
සඳමිණි....
පුංචි දෝනි
ඔබයි මගේ ජීවිතේ...

සුවහසක් කල් පුරා
මහමෙරක් වෙහෙස දරා
සුපිපුණු කුසුම මේ
පුදමි ඔබට සෙනෙහසින්...

# උපකාරානුස්මෘතිය

- අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය, ශාස්ත්‍රපති උපාධි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා වූ මෙම ස්වාධීන පර්යේෂණ නිබන්ධය සකස් කිරීම සඳහා මා හට නිසිමඟ පෙන්වා දෙමින්, මෙය සාර්ථකව අවසන් කිරීමට නිසි උපදෙස් ලබා දෙමින් මා නිසි මඟට යොමු කළ මාගේ උපදේශාචාර්ය වූ මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර ගුරු පියාණන්ට,
- මෙම නිබන්ධයහි ගුණදොස් පෙන්වා දෙමින් අධීක්ෂණ කටයුතු සිදුකළ මහාචාර්ය දයා අමරසේකර මැතිතුමන්ට,
- රුහුණු විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය තේනබදු මැතිතුමන්ට,
- නිබන්ධය සකස් කිරීම සඳහා උපදෙස් ලබා දෙමින් මා දිරිමත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය නෙරංජි විජේවර්ධන මහත්මියට
- කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය අනූෂා එදිරිසිංහ මහත්මියට,
- පුහුණුව,බඳවා ගැනීම් හා ජාත්‍යන්තර දිසාව බාර නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මැතිතුමන්ට,
- ශ්‍රි ලංකා පොලිස් විද්‍යාලයෙහි අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි දමයන්ත විජයශ්‍රී මැතිතුමන්ට,
- වැලිකඩ කාන්තා අංශයෙන් අදාළ දත්ත සම්පාදනය කර ගැනීම සඳහා අවසර ලබා දෙමින් මා හට මහත් සේ උපකාර කළ බන්ධනාගාර කොමසාරිස් (පාලන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක තුෂාර උපුල් දෙණිය මැතිතුමන්ට,
- ශ්‍රි ලංකා පොලිස් විද්‍යාලයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන) පොලිස් අධිකාරි එච්. ඒ. සී. පුෂ්ප කුමාර මැතිතුමන්ට,
- ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයෙහි සහකාර අධ්‍යක්ෂ (පුහුණු) සහකාර පොලිස් අධිකාරි වයි. එල්. ලීලවංශ මැතිතුමන්ට,
- ශ්‍රි ලංකා පොලිස් විද්‍යාලය, ඇල්පිටිය ඒකකයෙහි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අශෝක ද සිල්වා මැතිතුමන්ට,
- ශ්‍රි ලංකා පොලිස් විද්‍යාලය, ඇල්පිටිය ඒකකයෙහි හිටපු ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනක ද සොයිසා මැතිතුමන්ට,
- දත්ත සම්පාදනය කර ගැනීමෙහිලා මා හට මහත් සේ උදව් උපකාර කරමින් මා දිරිමත් කළ ප්‍රධාන ජේලර් ඊ. කේ. ඩී. දුමින්ද මහත්මාට,
- රුහුණු විශ්වවිද්‍යාලයේ කළමණාකරණ පීඨයේ උපාධි අපේක්ෂිකා ගංගා සොයුරියට,
- රුහුණු විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී අනුර මහත්මාට,
- අතුරලිය විද්‍යාලයේ ආචාර්ය නුවන් හේවාගම මහත්මාට,

- මෙම නිබන්ධය සකස් කිරීම සඳහා මා පිටු පසින් සිට අවශ්‍ය කරනු ලබන ශක්තිය හා ධෛර්ය ලබාදුන් ආදරණීය බිරිඳ සමුද්‍රාට,
- විශේෂයෙන්ම මා හට මානසික සුවය ලබා දෙමින් අවැසි මානසික ශක්තිය ලබාදුන් මාගේ සදාදරණීය සෙව්මිණි. දෙව්මිණි, සඳමිණි මාගේ දියණියන් තිදෙනාට,
- මෙම උත්සාහය සඳහා නන් අයුරින් උපකාර කළ සියලු දෙනාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

# පටුන.


පිටුව.

පර්යේෂකයාගේ ප්‍රකාශය. i

අනුමැති පත්‍රය. ii

පිදුම. iii

උපකාරානුස්මෘතිය. iv

පටුන vi

වගු නාමාවලිය viii

රූප සටහන් නාමාවලිය ix

ප්‍රස්තාර නාමාවලිය ix

සංක්ෂිප්තය x

**පළමු පරිච්ඡේදය.**

**හැඳින්වීම.**

1.1 අධ්‍යයන පසුබිම. 1

1.2 අධ්‍යයන ගැටළුව. 4

1.3 අධ්‍යයනයේ අරමුණු. 5

**දෙවන පරිච්ඡේදය.**

**සාහිත්‍යය විමර්ශනය**

2.1 මත්ද්‍රව්‍යය. 6

2.2 මත්ද්‍රව්‍යය වැරදි සහ එහි නීතිමය තත්වය. 8

2.3 බන්ධනාගාරය. 10

2.4 කාන්තාව. 14

2.5 සමාජගත කිරීම හා පුනරුත්ථාපනය. 17

2.6 සමාජගත කිරීම හා සම්බන්ධ මූලධර්ම. 18

2.7 සමාජගත කිරීම හා පුනරුත්ථාපනයට අදාළදේශීය හා ජාත්‍යන්තර නීති ප්‍රතිපාදන. 25

2.8 වරදකරුවන් සමාජගත කිරීම හා සම්බන්ධ ගැටළු. 27

2.9 විෂයගත විද්වත් පර්යේෂණ හා රික්තය හඳුනා ගැනීම. 31

**තෙවන පරිච්ඡේදය.**

**අධ්‍යයන ක්‍රමවේදය.**

3.1 අධ්‍යයන ක්ෂේත්‍රය හා නියැදිය. 35

3.1.1 නියදිගත කාන්තාවන්ගේ සමාජීය පසුබිම 36

3.1.2 වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයේ ක්‍රියාකාරිත්වය 38

3.2 දත්ත රැස්කිරීම හා මූලාශ්‍ර භාවිතය. 41

3.3 ප්‍රාථමික මූලාශ්‍ර භාවිතය 41

3.4 ද්විතියික මූලාශ්‍ර භාවිතය. 44

3.5 දත්ත විශ්ලේෂණය. 45

3.6 පර්යේෂණ සීමා 45

**සිව්වන පරිච්ඡේදය.**

**මත්ද්‍රව්‍ය වැරදි ආශ්‍රිතව බන්ධනාගාරත වූ කාන්තාවන්ගේ සමාජීය පසුබිම හා රැඳවියන් සඳහා වූ පුනරුත්ථාපන ක්‍රියාවලිය හඳුනා ගැනීම.**

4.1 බන්ධනාගාරය තුළ රැඳවියන් සඳහා වන පුනරුත්ථාපන ක්‍රියාවලිය හඳුනා ගැනීම 47

4.2 මත්ද්‍රව්‍යය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ කාන්තාවන් මුහුණ දෙන ගැටලු 54

4.2.1 පුනරුත්ථාපන ගැටලු 55

4.2.2 සමාජීය ගැටළු 63

4.2.3 නවීකරණය, නාගරීකරණය හා මත්ද්‍රව්‍යය 79

4.2.4 මනෝ විද්‍යාත්මක ගැටලු 81

**පස් වන පරිච්ඡේදය.**

**අධ්‍යයන සමාලෝචනය, නිගමන හා යෝජනා.**

5.1 අධ්‍යයන සමාලෝචනය. 91

5.2 නිගමන . 93

5.3 යෝජනා. 95

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය හා ඇමුණුම්.** 98

**වගු නාමාවලිය.**

වගු අංකඃ 3.1 නියදිය තෝරා ගැනීම 35

වගු අංකඃ 3.2 ප්‍රාථමික මූලාශ්‍ර භාවිතය සහ ඒ ආශ්‍රිතව රැස්කරන ලද දත්තවල ස්වභාවය. 44

වගු අංකඃ 4.1 බෞද්ධාගමික වැඩසටහන් සඳහා යොමු වූ රැඳවියන් සංඛ්‍යාව 58

වගු අංකඃ 4.2 ප්‍රදේශ අනුව මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධව බන්ධනාගාරගත වූ රැඳවියන්. 64

වගු අංකඃ 4.3 මත්ද්‍රව්‍යය වැරදි සඳහා යොමු වීමට පෙර රැඳවියන්ගේ මාසික ආදායම් තත්වය 69

වගු අංකඃ4.4 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ රැඳවියන්ගේ රැකියා තත්වය 69

වගු අංකඃ4.5 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ රැඳවියන්ගේ අධ්‍යාපන මට්ටම 72

වගු අංකඃ 4.6 පවුල තුළ ආර්ථික වගකීම දැරීම 73

වගු අංකඃ4.7 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ රැඳවියන්ගේ පවුල් අතර සම්බන්ධකම් 77

## රූප සටහන් නාමාවලිය.

රූප සටහන් අංකː 2.1 කාන්තාව වගකීම් දරන්නා වූ ප්‍රධාන භූමිකාවන් 14

රූප සටහන් අංකː 4.1 බන්ධනාගාර රැඳවියෙකු විශෝධනය වන අන්දම 48

රූප සටහන් අංකː 4.2 පුද්ගලයෙකු විශෝධනය කිරීමට පෙර අවස්ථා හඳුනා ගැනීම 49

රූප සටහන් අංකː 4.3 බන්ධනාගාරගත වූ රැඳවියෙකු සඳහා වූ විශෝධන ක්‍රියාවලිය 51

රූප සටහන් අංකː 4.4 රැඳවියෙකු සමාජගත කිරීමට අවශ්‍ය අන්තර් පුද්ගල සම්බන්ධතා 52

## ප්‍රස්තාර නාමාවලිය.

ප්‍රස්තාර අංකː4.1 පර්යේෂණ අවධිය වන විට කාන්තා අංශය තුළ වූ රැඳවියන්ගේ මුලු ගණන 57

ප්‍රස්තාර අංකː 4.2 මත්ද්‍රව්‍යය වැරදි සඳහා බන්ධනාගාරගත වූ රැඳවියන් 57

ප්‍රස්තාර අංකː 4.3 බෞද්ධාගමික වැඩසටහන් සඳහා යොමු වූ රැඳවියන් සංඛ්‍යාව 59

ප්‍රස්තාර අංකː4.4නියදියට අනුව මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ කාන්තාවන්ගේ දිස්ත්‍රික් ව්‍යාප්තිය 67

ප්‍රස්තාර අංකː4.5මත්ද්‍රව්‍යය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ රැඳවියන්ගේ, බන්ධනාගාරගත වීමට පෙර රැකියා තත්වය 70

ප්‍රස්තාර අංකː 4.6 මත්ද්‍රව්‍යය වැරදි හරහා ලබන ලද ආදායම 71

ප්‍රස්තාර අංකː 4.7 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ රැඳවියන්ගේ අධ්‍යාපන මට්ටම 73

ප්‍රස්තාර අංකː 4.8 පවුල තුළ ආර්ථික වගකීම දැරීම 74

ප්‍රස්තාර අංකː 4.9 නිදහස් වූ පසු ආර්ථිකය සකස් කර ගැනීම සම්බන්ධයෙන් රැඳවියන් දක්වන ලද අදහස් 75

ප්‍රස්තාර අංකː4.10 බන්ධනාගාර ගතවී ඇති කාන්තාවන් කෙරෙහි ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් විසින් සුවදුක් විමසීමට පැමිණීම 76

# සංක්ෂිප්තය


මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ කාන්තාවන් මුහුණපාන ගැටළු සම්බන්ධයෙන් මෙම අධ්‍යයනයේ දී විමසා බලන ලදී. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය පිළිබඳ ගැටළුව ගෝලීය ගැටළුවක් බවට වර්තමානය වනවිට පත්වී ඇත. ලාංකීය සමාජයට ද එම අභාග්‍ය සම්පන්න ඛේදවාචකයෙන් ව්‍යුත්පන්න වීමට හැකියාව ලැබී නැත. වර්තමාන ලාංකීය කාන්තාව ද මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ ගොදුරක් බවට පත්වීම අභාග්‍ය සම්පන්න තත්වයකි. කාන්තාව වේවා මොනයම් පුද්ගලයකු හෝ වේවා මෙම කණගාටුදායක තත්ත්වයට යොමුවීමට බොහෝවිට පවතින සමාජ, දේශපාලන, ආර්ථික සාධක පාදක වී ඇති බැව් අධ්‍යයනය තුළින් අනාවරණය කරගත හැකිවිය. මෙම අර්බුධකාරී තත්වය, සමාජය තුළ මුල් බැසගත් සමාජ, දේශපාලන, ආර්ථික සාධකයන් සාධනීය ප්‍රතිශෝධනයකට ලක් නොවන තාක්කල් සමනය කරගත නොහැකි, සමාජීය ගැටළුවක් ලෙස පවතිනු ඇත. මෙම අර්බුදය හමුවේ විනාශ වී යන්නේ ලාංකික ජාතියේ අනාගතයයි. දියණියක ලෙස, සහෝදරියක ලෙස, මවක ලෙස මහඟු මෙහෙවරක් ඉටුකරන කාන්තාව මෙලෙස මත්ද්‍රව්‍ය හරහා විනාශ වී යාම රටක අනාගතයේ අඳුරු බව කියා පාන්නකි. ජාතියක අවසානය සනිටුහන් කරන්නකි. හෙරොයින්, හෂීස්, කොකේන්, එක්ස්ටසි වැනි ප්‍රබල ඇබ්බැහිකාරී මත්ද්‍රව්‍යය සමාජගතවීම තුළ, කාන්තාව එහි ගොදුරු බවට පත්වීම අතිශයින් ඛේදජනක සංසිද්ධියකි. මත්ද්‍රව්‍යය දුර්භාවිතය තුළ නීතියේ රැහැනට නතුවන කාන්තාවගේ ඉරණම වන්නේ ඔවුන්ගේ සමස්ථ අනාගතයම අඳුරු අගාදයකට පත්වීමයි.

මත්ද්‍රව්‍යය වැරදි හා සම්බන්ධව නෛතික ක්‍රියාදාමය තුළට නතුවන කාන්තාවට අවසන හිමිවන්නේ බන්ධනාගාරයයි. අපරාධ යුක්ති පද්ධතිය තුළ වැදගත්ම සංකල්පය වනුයේ අපරාධකරුවන් පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරීමයි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා බන්ධනාගාරගත වන කාන්තාව බන්ධනාගාරය තුළ පුනරුත්ථාපනය වනවාට වඩා නැවත නැවතත් වැරදි ක්‍රියාවන් සඳහා පෙළඹවීමේ වැඩි ඉඩක් පවතින බව අධ්‍යයනය තුළින් සනාථ කර ගැනීමට හැකියාව ලැබුණි. බන්ධනාගාර පරිශ්‍රය තුළ රැඳවියන්ට කාල සටහනකට අනුව පනවන ලද නීති පද්ධතියක් තුළ ක්‍රියාකාරී වීමට සිදුවේ. උදෑසන 06 ට රැඳවුම් වාට්ටුවලින් එළියට ගන්නා රැඳවියන් සවස 06 ට නැවතත් ගණන් කර වාට්ටුවලට දමා වසනු ලැබේ. මේ අතරතුර ද ඔවුන් නැවත වට්ටුවලට දමා වසන අතර පැය 04 ක කාලයක් සිරකුටි හෝ වාට්ටුවලින් පිටත රැඳී සිටිය හැකිය. කෙසේ වුවද මෙහි පවතින අවාසනාවන්ත තත්ත්වය වනුයේ වඩා බරපතල අපරාධකාරියන් සමග මුහුවීමේ අවස්ථාව පැවතීමයි. ඇතැම් විටෙක බන්ධනාගාරගත වීමට පෙර සිට හඳුනන පිරිස් ද මෙහි සිටින අතර, ඔවුනොවුන් අතර අපරාධකාරී මනෝභාවයන් හුවමාරුවීම වැලැක්විය නොහැකිය.

බන්ධනාගාරය තුළ පවතින පුනරුත්ථාපන ක්‍රමවේදය තුළින් සිදුවිය යුත්තේ, මෙම කාන්තාවන් බන්ධනාගාරගතවීමට තුඩුදුන් සමාජ, දේශපාලන, ආර්ථික හා මනෝ විද්‍යාත්මක සාධකයන් ප්‍රථමයෙන් හඳුනා ගැනීමයි. ඒ අනුව මොවුන් කෙරෙහි දියත් කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන් සකස් විය යුතුය. එහෙත් එවැනි විද්‍යාත්මක පුනරුත්ථාපන

සැලැස්මක් බන්ධනාගාරය තුළ නොමැතිවීම කණගාටුවට කරුණකි. එමෙන්ම මනෝ විද්‍යාත්මක දැනුම සහිත පුනරුත්ථාපනය පිළිබඳ පුළුල් දැනුමක් සහිත පුහුණු පුනරුත්ථාපන නිලධාරීන් මනෝ උපදේශකවරුන් වැලිකඩ බන්ධනාගාරය තුළ අවමය. පෝය දිනයන්හි රැඳවියන් සඳහා ආගමික වැඩ සටහන් පැවැත්වීම ප්‍රශස්ත ක්‍රියාවලියකි. ආගමික වැඩසටහන් සඳහා ඇතැම් රැඳවියන් ඉතා උනන්දුවෙන් සහභාගී වන ආකාරය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය.

සිය දඬුවම් කාලය අවසන් වූවාට පසු මෙම රැඳවියන් පුනරුත්ථාපනය වුවද නොවූවද නැවතත් ඔවුන් සමාජය වෙත මුදාහැරිය යුතුය. මන්ද දඬුවම් කාලය අවසන් වී නම් ඔවුන් මුදාහැරිය යුතු හෙයිනි. සිය වැරදි පිළිබඳ අවබෝධයක් ලැබ සිය අපගාමී ජීවිතයෙන් සමුගන්නා පිරිස අවමය. මන්ද ඔවුන්ට නැවතත් ඒකාබද්ධ වීමට ඇත්තේ පෙර තමන් ජීවත් වූ අපගාමී පරිසරය තුළමය. අපගාමී මධුක්කු පරිසරය තුළ බන්ධනාගාරගත වී සිටි කාන්තාවන් වෙත වේවා පුරුෂයන් වෙත වේවා වැඩි පිළිගැනීමක් පැවතීම නැවතත් ඔවුන් අපරාධකාරී චර්යාවන්ට යොමුවීමට බලපානු ලබන ප්‍රබල උත්තේජනයකි. එහෙත් ග්‍රාමීය ප්‍රදේශවල මෙම තත්වය තරමක් වෙනස්ය. එහිදී එම සමාජය තුළින් ඔවුන් ප්‍රත්ක්ෂේප කිරීමේ තත්වයක් පවතී, නැවත රැකියාවක් ලබා ගැනීමේදී වුවද සිරගතවීම රැකියාවක් ලබාදීම සඳහා නුසුදුසු තත්වයක් ලෙස සලකනු ලැබේ."හිරේ ඉඳල ආපු ගෑනි" යනුවෙන් සමාජය වෙතින් ප්‍රතික්ෂේප කිරීම ද ප්‍රබල ගැටළුවකි. එම තත්වයද කාන්තාව නැවතත් අපරාධකාරී චර්යාවන්ට යොමු කිරිම සඳහා දෙනු ලබන උත්තේජනයකි.

පොලිස් අත්අඩංගුවට පත්වීමේ අවස්ථාවේ සිට අහිමිවන පුද්ගල ස්වාධීනත්වය, රැඳවියකුට නැවත හිමිවන්නේ සිරගත ජීවිතෙන් මිදුන දිනකය. මෙම කාන්තාව නෛතික ක්‍රියාදාමයන්ගේ ආධිපත්‍යය තුළ නතුවී සිටින්නියකි. සැබවින්ම එම අවස්ථාවේ සිටම ඔවුන් බරපතල ලෙස මානසික කම්පනයකට බිඳවැටීමකට ලක්වීම නොවැලැක්විය හැකි තත්වයකි. එම මානසික කම්පනයේ, බිඳවැටීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ සිරෙන් නිදහස් වන විට ඔවුන් මානසික ආතතිය, විෂාදය, කාංසාව, ඉච්ඡාභංගත්වය, වෛරය වැනි සයිකෝසීය රෝගී තත්වයන්ගෙන් පෙළෙන්නවුන් වීමය.

මෙම ක්ෂේත්‍ර පර්යේෂණය සඳහා වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශය යොදාගත් අතර නියදිය තෝරාගැනීමේදී ක්‍රමාන්විත නියැදි ක්‍රමය යොදාගෙන තිබුණි. අදාළ ක්‍රමවේදයට අනුව මත්ද්‍රව්‍යය වැරදි සඳහා බන්ධනාගාරගත වූ කාන්තාවන් 30 දෙනෙකු තෝරා ගැණුනි. ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත මූලාශ්‍ර අධ්‍යයනය සඳහා උපයෝගි කරගන්නා ලදී. මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටළුව වූයේ නෛතික ක්‍රියාවලිය තුළින් බන්ධනාගාරගත වූ කාන්තාවන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේදි මතුවන ගැටළුකාරී තත්ත්වයන් හඳුනා ගැනීමයි. ඒ සඳහා දත්ත දායිකාවන් 30 දෙනෙකුගෙන් යුත් නියැදියක් වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයෙන් තෝරා ගැනුණි.